# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2326/15 - 2023 අප්‍රේල් මස 03 වැනි සඳුදා - 2023.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය - Bu/Ln/1/1/15

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය - 4-3/2/2017/VE/353

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අතුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 530431 හි, කලාප අංක 01හි, ඉඩම් කැබලි 1 හි සඳහන් මිරිස්හේනවත්ත ඉඩමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.8094 හි මායිම් පහත දැක්වේ:

1. **කැබලි අංක 01- මිරිස්හේනවත්ත - ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8094**

උතුරට - අතුර (කොටසක්)
නැගෙනහිරට - අතුර (කොටසක්) සහ මාර්ග (ප්‍රා.ස)
දකුණට - මාර්ග (ප්‍රා.ස.) සහ අතුර (කොටසක්)
බටහිරට - අතුර (කොටසක්)

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 අප්‍රේල් මස 26 වැනි දින පෙ.ව. 10.00 ට බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2023 අප්‍රේල් මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

පී. ආර්. ප්‍රසාද් පෙරේරා,
ප්‍රාදේශීය ලේකම් ,
බුලත්සිංහල.

2023 මාර්තු මස
බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04-0030


1A - G 039297 – 14 (2023/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*